# මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் அமைச்சு
# MINISTRY OF FINANCE AND PLANNING



මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01 Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: PFD/PMD/Clari/11/02
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2012.01.05

**රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක : 01/ 2012**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ දිස්ත්‍රික් ලේකම්වරුන්,
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, අධිකාරී සහ
රජය සතු සමාගම්වල සභාපතිවරුන් වෙත.

**ප්‍රජා පාදක සංවිධාන සඳහා සෘජු කොන්ත්‍රාත් පැවරීමේ ක්‍රමය**

ප්‍රජා පාදක සංවිධාන සඳහා සෘජු කොන්ත්‍රාත් පැවරීම සම්බන්ධව නිකුත් කර ඇති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 452 හි සඳහන් උපදෙස් හා බැඳේ.

2. ප්‍රජා පාදක සංවිධානවලට රජයේ කොන්ත්‍රාත් පැවරීම සඳහා සුදුසුකම් තක්සේරු කිරීමේ නිර්ණායකයක් ලෙස එම සමිති 'ඉක්ටාඩ්' ආයතනයේ ලියාපදිංචි වීම අවශ්‍ය නොවේ.

3. ප්‍රජා පාදක සංවිධානවලට සෘජු කොන්ත්‍රාත් පැවරීමේදී බල පැවැත්වෙන කොන්දේසි සහ අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත පහත දක්වේ.

3.1. දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නම් කරනු ලබන නියෝජිතයින් දෙදෙනකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුවක් මගින් මෙහි අංක 3.2 යටතේ සඳහන් කර ඇති සුදුසුකම් පරීක්ෂා කර සතුට කිරීමෙන් අනතුරුව පහත සඳහන් ප්‍රජා පාදක සංවිධාන වෙත ඉදිකිරීම් වැඩ කොන්ත්‍රාත්තු පැවරිය හැකිය.

I. සමෘද්ධි බලකායන්/සමෘද්ධි සමිති
II. විවිධ සේවා සමුපකාර සමිති
III. සමුපකාර කම්කරු සමිති (කම්කරු සේවා සඳහා පමණක්)
IV. ග්‍රාම සංවර්ධන සමිති
V. පාසල් සංවර්ධන සමිති (බල සීමා ප්‍රදේශයට අදාලව පාසැල් පරිශ්‍රයන්හි ක්‍රියාත්මක)
VI. අනුමත ගොවි සංවිධාන
VII. ග්‍රාමෝදය මණ්ඩල සහ ප්‍රජා සංවර්ධන සමිති (පළාත් පාලන ක්ෂේත්‍රයේ සංවර්ධන කටයුතුවලට දායක වන්නා වූ සමිති)
VIII. ගැමි දිරිය මහජන සමාගම්
IX. සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය යටතේ ලියාපදිංචි කරන ලද සහාධිපත්‍ය කළමනාකරණ සංස්ථා
X. විහාරස්ථ කාර්ය සාධන සමිති (ස්වකීය විහාරස්ථාන හා දහම් පාසල් පරිශ්‍රයන්හි ක්‍රියාත්මක)
XI. විහාරස්ථ දායක සභා (ස්වකීය විහාරස්ථාන හා දහම් පාසල් පරිශ්‍රයන්හි ක්‍රියාත්මක)

XII. සමාජ සේවා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලයේ ලියාපදිංචි ග්‍රාමීය වැඩිහිටි කමිටු

XIII. ප්‍රාදේශීය ලේකම්වරයාට සෑහීමකට පත් විය හැකි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් හඳුනාගන්නා ප්‍රජා සංවිධාන

3.2. මෙම ප්‍රජා පාදක සංවිධාන පිළිබඳව ඉහත කී කමිටුව විසින් පහත සඳහන් ලිපි ලේඛන පරීක්ෂා කර යෝග්‍යතාව සමාලෝචනය කිරීමෙන් අනතුරුව සුදුසු ප්‍රජා පාදක සංවිධානවලට වැඩ කොන්ත්‍රාත් පැවරීම නිර්දේශ කළ හැකිය.

i. බැංකු ප්‍රකාශ සහ අසිරා පහසුකම් අනුමත කරන සමෘද්ධි බැංකු, සමූපකාර බැංකු හෝ ග්‍රාමීය බැංකු වැනි මූල්‍ය ආයතන විසින් බැංකු සහ මූල්‍ය පහසුකම් ඇති බව සනාථ කරන ලිපි ලේඛන

ii. සමාන වැඩ පිළිබඳව පෙර පළපුරුදුකම්වලට දායක වී ඇති බවට අදාළ සහතික හෝ ඉටු කර ඇති වැඩ පිළිබඳ මෙන්ම ඒවායේ ප්‍රමිතීන් පිළිබඳ සෑහීමකට පත් විය හැකි සාක්ෂි

iii. අවුරුද්දකට පෙර පිරිනමන ලද නමුත් අසම්පූර්ණ කොන්ත්‍රාත්ද ඇතුළුව ඉකුත් වසර තුළ ඔවුනට පිරිනමන ලද කොන්ත්‍රාත් වැඩ පිළිබඳව අදාළ සමිතිය නිකුත් කර ඇති ප්‍රකාශයක් (කොන්ත්‍රාත් නාමය, ස්ථානය, සේවාදායක, කොන්ත්‍රාත්තුවේ වටිනාකම සහ වර්තමාන තත්ත්වය)

iv. අදාළ කාර්යය උප කොන්ත්‍රාත් නොදෙන බවට සමිතියෙන් නිකුත් කළ ප්‍රකාශයක් (උප කොන්ත්‍රාත්වල යෙදුන හොත් එවැනි සමිති/සංවිධාන අසාධු ලේඛන ගත කළ යුතුය)

3.3. කොන්ත්‍රාත්තුව පිරිනමන අවස්ථාවේදී අදාළ ප්‍රජා පාදක සංවිධානය කොන්ත්‍රාත් තුනකට වඩා වැඩි කොන්ත්‍රාත් ප්‍රමාණයක නිරත වී නොසිටිය යුතුය. එසේ වුවද, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් ආවරණය වන පරිදි පිහිටුවා ඇති යම් ප්‍රජා පාදක සංවිධානයක බල ප්‍රදේශය මුළු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයම වන අවස්ථාවක දී සහ එම කොට්ඨාශයේ විවිධ ක්ෂේත්‍රයන්හි කොන්ත්‍රාත් වැඩ ඉටුකිරීමට ප්‍රමාණවත් මූල්‍ය, ශ්‍රම සහ ව්‍යවසායක හැකියාවන් ඇති බවට පෞද්ගලිකවම සෑහීමකට පත්වන අවස්ථාවක ප්‍රාදේශීය ලේකම්වරයාට දිස්ත්‍රික් ලේකම්වරයාගේ අනුමැතිය ඇතිව යම් ප්‍රජා පාදක සංවිධානයකට කොන්ත්‍රාත් තුනකට වඩා වැඩි ප්‍රමාණයක් ලබාදිය හැකිය.

3.4. පවරනු ලබන කොන්ත්‍රාත්තුව ප්‍රජා පාදක සංවිධානයේ/සමිතියේ බල ප්‍රදේශ සීමාවන් තුළ විය යුතුය.

3.5. දෙපාර්තමේන්තු ප්‍රධානියා, අදාළ දිස්ත්‍රික් ලේකම්වරයා හෝ ප්‍රාදේශීය ලේකම්වරයා මෙම ප්‍රජා පාදක සංවිධාන විසින් කරනු ලබන කොන්ත්‍රාත් කටයුතු මනා ප්‍රමිතියකින් යුතුව සිදුකරන බවටත්, අදාළ තාක්ෂණික අධීක්ෂණය සිදු කිරීමට අවශ්‍ය කටයුතු පිළියෙල කරන බවටත් වග බලා ගත යුතුය.

3.6. ඉටු කරනු ලබන කාර්යය පිළිබඳව ප්‍රජා පාදක සංවිධානයේ නම, එම ව්‍යාපෘතියට රජය දරූ වියදම, ප්‍රජා පාදක සංවිධානයට කොන්ත්‍රාත්තුව ලබා දුන් ආයතනයේ නම, ප්‍රතිලාභීන් ගණන ආදී විස්තර සහිත නාම පුවරුවක් ප්‍රදේශයේ ප්‍රජාවගේ දැන ගැනීම සඳහා සකස් කළ යුතුය.

4. මෙයට අදාළව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.9.1. ට අදාළව නිකුත් කර ඇති අතිරේක සහ රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 452 අවලංගු කරනු ලබන අතර ඒ වෙනුවට මෙම චක්‍රලේඛය පමණක් අදාළ කරගන්නා ලෙස දන්වමි.



පී.බී. ජයසුන්දර
භාණ්ඩාගාර ලේකම්